**මුදල් අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු අතර (රේගු, සුරාබදු හා දේශීය ආදායම්)**
**අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ පරිපාටිය - 2022**

ස්ථාන මාරුවීම් සඳහා අදාළ සේවාවන් පහත පරිදි වේ.

| | | රැඳී සිටිය හැකි උපරිම කාලසීමාව |
|---|---|---|
| 1. | රජයේ භාෂා පරිවර්තක සේවය | වසර 5 |
| 2. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | වසර 5 |
| 3. | සංවර්ධන නිලධාරි සේවය | වසර 3 |
| 4. | කළමනාකරණ සේවා නිලධාරි සේවය | වසර 5 |
| 5. | කාර්යාල සේවක සේවය | වසර 5 |
| 6. | ඒකාබද්ධ රියදුරු සේවය | වසර 5 |

**1. ඉහත දෙපාර්තමේන්තු සඳහා ස්ථාන මාරු අයදුම් කිරීමේදී සම්පූර්ණ කළයුතු සුදුසුකම්**

1.1. මුදල් අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු ලද ඉහත සේවාවන්ට අයත් නිලධාරියෙක් අමාත්‍යාංශයේ වසර 2 ක සේවා කාලයෙන් පසු මෙම ලේඛනයට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි.

1.2. මුදල් අමාත්‍යාංශයට පළමු පත්වීම් ලැබූ හෝ පරිවාස කාලය තුළ මෙම අමාත්‍යාංශයට පැමිණි ඉහත සේවාවල නිලධාරීන් සේවයේ ස්ථිර වූ පසු එතැන් සිට වසර 02ක් සම්පූර්ණ වීමෙන් අනතුරුව පමණක් ඉහත දෙපාර්තමේන්තු වෙත අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි. එහිදී ඔවුන්ගේ මුදල් අමාත්‍යාංශයේ සේවා කාලය සලකනු ලබන්නේ පරිවාස කාලය සම්පූර්ණ කරන ලද දින සිටය.

1.3. පොරොත්තු ලේඛනයේ තවදුරටත් ස්ථාන මාරුවීම සඳහා නිලධාරීන් නොමැති අවස්ථාවලදී දේශීය ආදායම් සහ සුරාබදු දෙපාර්තමේන්තු වෙත අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදීම සඳහා ඉහත 1.2 හි සේවා කාලය සැලකිල්ලට නොගැනේ.

1.4. මුදල් අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘතියක හෝ ආයතනයක ද්විතීයන පදනම මත සේවය කර ඇත්නම් එම කාලසීමාව ඉහත වසර ගණනින් අඩුකරනු ලැබේ.

1.5. අංක 2235/45 හා 2021.07.07 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන, තක්සේරු හා ජාතික ක්‍රමසම්පාදන යන දෙපාර්තමේන්තු සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය අමාත්‍යාංශ විෂය පථයෙන් ඉවත්වූ බැවින් එම කාර්යාලවල සේවයේ නියුතු ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ටද, එම දෙපාර්තමේන්තු මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතේ පැවති කාලසීමාව තුළ ඔවුන් අමාත්‍යාංශයට පැමිණි දිනය අනුව අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදිය යුතු බව 2021.07.20 දින පැවති 2022 ස්ථාන මාරු පටිපාටිය සකස්කිරීමේ රැස්වීමේදී තීරණය විය.

1.6. වෙනත් අමාත්‍යාංශයක් යටතේ පැවති, පසුව මුදල් අමාත්‍යාංශය යටතට පත්ව ඇති පහත නම් සඳහන් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ මුදල් අමාත්‍යාංශයේ සේවා කාලය ගණන්ගනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවී පැමිණි දිනය අනුව හා එම දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාව මත වන අතර ඒ අනුව සේවා කාලය ගණනය කර ප්‍රමුඛතාවය තීරණය කිරීම සිදුකරනු ලැබේ.

* මෙම දෙපාර්තමේන්තු අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වූ දිනට පසු එම දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු උපලේඛනයට ඇතුළත් කිරීමේදී, නැවත එම දෙපාර්තමේන්තු අමාත්‍යාංශ විෂය පථයට ඇතුළත් වූ දිනය ඔවුන් දෙපාර්තමේන්තුවට පැමිණි දිනය ලෙස සැලකේ.

| | දෙපාර්තමේන්තුව | අමාත්‍යාංශයෙන් ඉවත්වූ දිනය | නැවත අමාත්‍යාංශ විෂය පථය යටතට පත්වූ දිනය | නැවත අමාත්‍යාංශයෙන් ඉවත්වූ දිනය |
|---|---|---|---|---|
| 01 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන | 2015.01.18 | 2019.12.10 (2153/12 දරණ අති වි. ගැසට් පත්‍රය) | 2021.07.07 (2235/45 දරණ අති වි. ගැසට් පත්‍රය) |
| 02 | ජාතික ක්‍රමසම්පාදන | 2015.01.18 | | |
| 08 | තක්සේරු | - | - | |
| 09 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | | | |
| 03 | ආනයන හා අපනයන පාලන | 2015.09.27 | 2019.12.10 | - |
| 04 | සමාගම් රෙජිස්ට්‍රාර් | - | | |
| 05 | ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ | 2015.09.21 | 2018.12.28 (2103/33 දරණ අති වි. ගැසට් පත්‍රය) | |
| 06 | විදේශ සම්පත් | 2015.01.18 | | |
| 07 | කළමනාකරණ විගණන | 2017.06.07 | | |

ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කරන ලදුව දැනට මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරන ලද නිලධාරීන් පිටතට වූ ස්ථාන මාරුවලට යටත් වේ.

1.8 විශ්‍රාම යාමට ආසන්න නිලධාරියෙකු ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා 2021.12.31 දිනට වයස අවුරුදු 55 සම්පූර්ණ කල යුතු අතර, අවම වශයෙන් අමාත්‍යාංශය යටතේ සේවා කාලය අවුරුදු 03ක් සම්පූර්ණ කර තිබිය යුතුය. මේ සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10 ට 2 යන අනුපාතයෙනි.

## 2. ස්ථාන මාරු අයදුම් පත්‍ර

2.1 ස්ථාන මාරු අයදුම්පත් 2021.08.10 දිනට පෙර එවන මෙන් දන්වන අතරම එදිනෙන් පසු ලැබෙන අයදුම්පත් නොසලකා හරිනු ලැබේ.

2.2 මුදල් අමාත්‍යාංශයට වාර්තා කළ ලිපියේ පිටපතක් සමඟ අදාළ අයදුම්පත්‍රය යොමුකළ යුතුය

2.3 යම් නිලධාරියකු විසින් ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ දී අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන අතරම ඉදිරි වසර දෙක සඳහා ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකමක් නොලැබේ.

## 3. ස්ථාන මාරු කමිටු

**3.1** ස්ථාන මාරු කමිටු පහත පරිදි පිහිටවනු ලබයි.

3.1.1. ස්ථාන මාරු කමිටු

යොමු වී ඇති අයදුම්පත්‍රවල ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

- ස්ථාන මාරු සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර ලැබී ඇති විට සේවාවන් සඳහා පොදුවේ ස්ථාන මාරු කමිටුවක් පත්කර ගනු ලබයි. මෙම ස්ථාන මාරු සම්බන්ධයෙන් අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටියේ 1 හි සඳහන් සුදුසුකම් හා 4 හි සඳහන් පොදු කරුණු අදාළ කරගනු ලැබේ

3.1.2. ස්ථාන මාරු අභියාචනා කමිටු

ස්ථාන මාරු සම්බන්ධයෙන් යොමු වී ඇති අභියාචනා තවදුරටත් සැලකිල්ලට ගනු ලබන අතර අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටියේ 1 හි සඳහන් සුදුසුකම් හා 4 හි සඳහන් කරුණු හා අභියාචනය කරනු ලබන කරුණුවල සාධාරණත්වය සැලකිල්ලට ගනු ලබයි.

**4. ස්ථාන මාරු හා පොෂ්‍යතා ලේඛනය සකස් කිරීමේදී සලකා බලනු ලබන වෙනත් කරුණු :**

4.1 රේගු, දේශීය ආදායම් හා සුරාබදු දෙපාර්තමේන්තු වලට ඉල්ලා ඇති ස්ථාන මාරු අයදුම්පත් සලකා බලනු ලබන්නේ ඒවායේ අවුරුදු (05)කට හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙනය.

4.2 ඉහත දෙපාර්තමේන්තුවල වසර 5 ක සේවා කාලයක් අවසන් කරන දිනයේදීම එම දෙපාර්තමේන්තු වලින් පිටතට ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වේ. වසර 05ක සේවා කාලය ගණන් ගනු ලබන්නේ ලිත් වර්ෂය පදනම් කොටගෙන නොව එම දෙපාර්තමේන්තුවලට නිලධාරියෙකු ස්ථාන මාරු කරන ලද දිනය අනුව වේ. ඒ අනුව 2021.12.31 දිනට හා එදිනෙන් පසු 2022.12.31 දින දක්වා වසර 05 සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථාන මාරුකිරීම් වලට යටත් වේ.

4.3 ඉහත සඳහන් දෙපාර්තමේන්තුවල මීට පෙර සේවය කර ඇති නිලධාරීන් නැවතත් එම දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු නොකරන අතර, 2022 වර්ෂයට අදාළ ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.3.1 ඡේදය යටතේ දක්වා ඇති දෙපාර්තමේන්තුවක හෝ ද්විතියන පදනම මත ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කර ඇති නිලධාරීන් ද ඉහත අංක 02 හි සඳහන් දෙපාර්තමේන්තු/ ආයතනවලට ස්ථාන මාරු කරනු නොලැබේ. ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2021 හි වාර්ෂික ස්ථාන මාරු පරිපාටියේ 5.2 ඡේදයේ සඳහන් කරුණු ද මීට අදාළ කරගනු ලබන අතර, ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවල සේවය කරන අවුරුදු 59 ඉක්ම වූ නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට අගතියක් නොවන ලෙස ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

4.4 ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක වසර 05 සම්පූර්ණ කර ඇති නිලධාරීන් විධිමත් ස්ථාන මාරුවීමක් ලැබෙන තුරු, මෙම අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවකෙ හෝ අභ්‍යන්තර ස්ථාන මාරු ලබන නිලධාරියෙකු වෙනුවට තාවකාලිකව අනුයුක්ත කරන්නේ නම් එම නිලධාරියාට නියමිත දිනට විධිමත් ස්ථාන මාරුවීමක් ලබාදීම සඳහා ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

4.5 එසේම, ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක වසර 05 සම්පූර්ණ කර (2022.06.30 දිනෙන් පසු) නැවත අමාත්‍යාංශය වෙත පැමිණෙන නිලධාරීන්, වසර 05ට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ ලේඛනයට ඇතුළත් කොට ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ලබාදීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරන අතර එවැනි නිලධාරීන් සඳහා සුහද ස්ථාන මාරු හෝ අනුප්‍රාප්තිකයෙකු රහිත ස්ථාන මාරුවීම් හෝ සඳහා අවස්ථාව ලබාදෙනු නොලැබේ.

4.6 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු එවැනිම වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු නොකළ යුතුය. විභාග දෙපාර්තමේන්තුව (සංවර්ධන නිලධාරී සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය හා කාර්යාල සේවක සේවය සඳහා අදාල නොවේ.)/ විදේශ කටයුතු අමාත්‍යාංශය (රජයේ භාෂා පරිවර්තක සේවය, සංවර්ධන නිලධාරී සේවය හා කළමනාකරණ සේවා නිලධාරී සේවය සඳහා අදාළ නොවේ)/ මෝටර් රථ ප්‍රවාහන (සංවර්ධන නිලධාරී තනතුරු නොමැත)/ ආගමන හා විගමන (සංවර්ධන නිලධාරී තනතුරු නොමැත.)/ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ රේගු/ දේශීය ආදායම්/ සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රියමනාප දෙපාර්තමේන්තු හා ආයතන ලෙස සලකනු ලැබේ. එවැනි සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරියෙකු එම ආයතනයක සේවා කාලය වසර 05ක් නොඉක්මවූ විට ඉතිරි කාලය මෙම අමාත්‍යාංශය යටතේ වන ප්‍රියමනාප දෙපාර්තමේන්තුවක රැඳී සිටීමට අවස්ථාව ලබාදිය යුතුය.

4.7 ප්‍රියමනාප යැයි සැලකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා කාලය ගණනය කිරීමේ දී එම කාලය තුළදී ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත සහ අඩ වැටුප් සහිත) කාලය ගණනය කරනු නොලැබේ. ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියක් ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කරන විට ලබා ඇති ප්‍රසූත නිවාඩු පිළිබඳව සඳහන් කිරීම අනිවාර්ය වන අතර එසේ නොකොට අභියාචනා මණ්ඩලවලදී ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් කරන දැනුම්දීම් සැලකිල්ලට නොගැනේ.

4.8 එම දෙපාර්තමේන්තු/ ආයතන වලට ස්ථාන මාරු කිරීමේදී මුදල් අමාත්‍යාංශය හෝ ඒ යටතේ වන වෙනත් දෙපාර්තමේන්තු වල සේවය කළ යුතු අවම සේවා කාලයක් නියම නොකරන අතරම, එම ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තු වලින් ස්ථාන මාරු වී යන සේවක සංඛ්‍යාව මත ස්ථාන මාරු කරන නිලධාරීන් සංඛ්‍යාව තීරණය කෙරේ. මෙම දෙපාර්තමේන්තු වලින් පිටතට යන සංඛ්‍යාවට වඩා මාරුවීම් ඉල්ලා ඇති සංඛ්‍යාව වැඩි වන විට තෝරාගැනීමේ සාමාන්‍ය පිළිවෙත වන්නේ, මුදල් අමාත්‍යාංශයේ අඛණ්ඩ වැඩිම සේවා කාලය ඇති හා පරිවාස කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් වේ. එකම දිනයේ දී අමාත්‍යාංශයට පැමිණ ඇති නිලධාරීන්ගේ ප්‍රමුඛතාවය තීරණය කරනු ලබන්නේ ඔවුන්ගේ මුළු සේවා කාලය සැලකිල්ලට ගෙනය. ඉහත දිනයන් දෙකම සමාන වන අවස්ථාවේදී නිලධාරියාගේ හෝ නිලධාරිනියගේ වයස සැලකිල්ලට ගනු ලබයි.

4.9 2022 වර්ෂයේ ප්‍රතිලාභ ලබන සේවා ස්ථාන වලට ස්ථාන මාරුවීම් කරනු ලැබීමේදී මුදල් අමාත්‍යාංශ සේවා කාලය ගණනය කරනු ලබන්නේ දැනට සේවයේ යෙදී සිටින සේවයට උසස්වීම් ලද දින සිටය.

උදාහරණ : කළමනාකරණ සේවා නිලධාරි සේවය

4.10 මුදල් අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් වෙනුවෙන් කල්වේලා ඇතිව සුදුසු නිලධාරීන් පුහුණු කරවා ගැනීම අවශ්‍ය වන අතර, මාරුවීම් ලද නිලධාරියෙකු අදාළ දිනයේ දී එම නිලධාරියාගේ හිමිකම් වලට බාධා නොවන පරිදි ස්ථාන මාරු කළ යුතුය.

4.11 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නොකර ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් එසේ නිර්දේශ නොකිරීමට හේතුන්ද සඳහන් කර එවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ එකඟතාවය මත ස්ථාන මාරුකිරීමට අදාළ තීරණය ගනු ලැබේ.

4.12 මෙම දෙපාර්තමේන්තු වලට වාර්ෂික ස්ථාන මාරු කිරීමෙන් පසුව එම වර්ෂයේ ඉදිරියට ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා පොරොත්තු ලේඛනයක් වාර්ෂිකව සකස් කරනු ලබන අතර, එම පොරොත්තු ලේඛන වලින් බැහැරව ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.

**4.13 සංවර්ධන නිලධාරීන් විශාල සංඛ්‍යාවක් දැනට පොරොත්තු ලේඛනයේ රැඳීසිටින බැවින් රේගු, සුරාබදු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කිරීමේදී එම දෙපාර්තමේන්තුවල රැඳී සිටිය හැකි කාලසීමාව උපරිම වසර 03 දක්වා පමණක් සීමාකර ඇත.**

4.14 සුරාබදු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවල ප්‍රධාන කාර්යාලවලට පමණක් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදෙනු ලැබේ. එම දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය කාර්යාල සඳහා වන ස්ථාන මාරු, ඒ ඒ දෙපාර්තමේන්තුවල පවතින අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිවලට අනුව ක්‍රියාත්මක වනු ඇත.

4.15 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී අභියාචනා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර, නැවත අභියාචනා සලකා බලනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකු ස්ථාන මාරු කර ඇත්නම් ඒ අනුව නිලධාරියා නියමිත දිනයේ දී මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා අනිවාර්යෙන්ම ක්‍රියාකල යුතුය. එසේ නොකරන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව අදාළ බලධාරීන්ට වාර්තා කිරීමට සිදුවේ.

4.16 දේශීය ආදායම්, රේගු හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වෘත්තීය සමිති නියෝජිතයින් සම්බන්ධයෙන් 03/2018 ඒකාබද්ධ සේවා ස්ථාන මාරු පරිපාටිය අනුව කටයුතු කරනු ලැබේ. ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති වෘත්තීය සමිති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත්වන අතර, ඔවුන් කැමති නම් ප්‍රතිලාභ රහිත දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරුවීමක් ලබා දිය හැකිය.

4.17 නිලධාරියෙකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවීමක් ලබා දී ඇති විටෙක,

(1) එම නිලධාරියා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කරගැනීම සඳහා ඉල්ලීමක් කොට එය අවලංගු කරගන්නේ නම් ඔහුට (ඉතාමත් සාධාරණ ඉල්ලීමකට හැර) ඉදිරි වසර 03ක් දක්වා ස්ථාන මාරු සඳහා ඇති හිමිකම අහිමි වනු ඇත.

(II) සේවා අවශ්‍යතාවය මත දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අදාල නිලධාරියාගේ ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම් එම ස්ථාන මාරුව අවලංගු කිරීම වසරක කාලයක් සඳහා පමණක් සිදුකරනු ලබන අතර, එම ඉල්ලීම

a) අභියාචනා මණ්ඩල රැස්වීමට පෙර ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඉදිරි වසරේදීත් එම නිලධාරියා විසින් ඉල්ලුම් කරනු ලබන රේගු, සුරාබදු හෝ දේශීය ආදායම් යන ඕනෑම ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයකටද,

b) අභියාචනා මණ්ඩල රැස්වීමට පසු ඉදිරිපත්කරනු ලබන්නේ නම් ඉදිරි වසරේදීත් පෙර වසරේ ඉල්ලුම් කරනු ලැබූ ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයටම පමණක්ද,

ස්ථාන මාරුව ලබාදීමට කටයුතු කරනු ලැබේ.

4.18 අදාළ සේවයේ අය ප්‍රතිලාභ සහිත සේවා ස්ථාන වලට ස්ථාන මාරු කිරීමේ දී පන්ති/ ශ්‍රේණි අනුව නොව අමාත්‍යාංශයේ සේවා කාලයේ ප්‍රමුඛතාවය අනුව ස්ථාන මාරු කරනු ලැබේ.

4.19 ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවක සේවය කරන අතරතුර රජයේ ප්‍රතිපත්තිමය කාරණාවක් නොවන අවස්ථාවක දී විදේශ ගතවුවහොත්, එනම් පෞද්ගලික නිවාඩු මත විදේශගත වීමේදී එම විදේශ ගතවී සිටින කාලය ප්‍රතිලාභ ලබන ආයතනයක සේවා කාලයට බලපෑමක් ඇති කරනු නොලබයි. (එනම් විදේශ ගතවී සිටින කාලය ප්‍රතිලාභ ලබන සේවා කාලයෙන් අඩු කරනු නොලැබේ.)

4.20 ස්ථාන මාරුවීම් පිළිබඳ යම්කිසි ගැටලුවක් මතුවුවහොත් අමාත්‍යාංශ ලේකම්තුමාගේ තීරණය අවසන් තීරණය වේ.

**2022 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය සකස් කිරීමේ මණ්ඩලය**

**2021.07.20**